# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/09/12/12/07/01 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.09.12 |

චක්‍රලේඛ අංකය : 31/2022

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
පරිවේණාධිපතිවරු
සියලුම පාසල්වල විදුහල්පතිවරු වෙත

**2022 හා 2023 වර්ෂවලට අදාළව 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග සහ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රශ්න පත්‍ර සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත පදනම් කරගැනීම.**

ශ්‍රී ලංකාවේ, පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමේදී ගෝලීය කොරෝනා වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය සෘජුව බලපෑම් එල්ල කර ඇත. මෙහිදී සිසුනට වන ඉගෙනුම් පාඩුව (learning loss) අවම කිරීම සඳහා විවිධ ක්‍රමෝපායන් යොදා ගන්නා ලද අතර, දුරස්ථ අධ්‍යාපන ක්‍රියාවලිය ද ඒ සඳහා බහුල වශයෙන් යොදා ගන්නා ලදී.

එසේ වුවද, සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය කිරීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ ගැටලු සහගත තත්ත්වය පිළිබඳව විශේෂ අවධානය යොමු කර පහ ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගය හා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කෙරෙන බව කාරුණිකව දන්වමි.

**1.0 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය**

3,4,5 ශ්‍රේණිවලට අදාළ ව හඳුනාගෙන ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත මත පදනම් වීම.

**2.0 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය**

10 සහ 11 ශ්‍රේණිවලට අදාළ ව හඳුනාගෙන ඇති එක් එක් විෂයයට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත මත පදනම් වීම.

ඒ අනුව, මේ වන විට ජාතික අධ්‍යාපන ආයතනය විසින් ලබා දී ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය. එම අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත විෂය නිර්දේශ අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය www.moe.gov.lk සහ ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවිය www.nie.lk වෙතින් බාගත කරගත හැකි අතර Channel NIE YouTube නාලිකාවට ද ඇතුළත් කර ඇත.

ඉහත කරුණු අනුව අදාළ විභාග සඳහා සිසුන් සූදානම් කිරීමට මෙන්ම මේ සම්බන්ධව ගුරුවරුන්ගේ අවධානය යොමු කිරීමට කටයුතු කරන ලෙස ද දන්වමි. මෙම සංශෝධන 2022 සහ 2023 වර්ෂවලට අදාළව පැවැත්වෙන අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හා 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගය සඳහා පමණක් බලපැවැත්වෙන බව තවදුරටත් දන්වා සිටිමි.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්: 01. සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරු - කරු. අ.ක.ස./දැ.ගැ.ස.
02. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව - කරු. අ.ක.ස./දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය) - කරු. අ.ක.ස./දැ.ගැ.ස.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832, +94112784825, minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary — +94112784811, +94112785162, secretary.education@moe.gov.lk